

# තලන්ගම ජයසිංහ තවමත් පෙරමුණේ

## තලන්ගම ජයසිංහ

*කොළඹට නුදුරින් පිහිටි තලංගම ග්‍රාමයේදී ඔහු මෙලොව එළිය දුටුවේ 1936 ජූලි 05 දිනය. ජෝර්ජ් ඇල්බට් ජයසිංහ සහ දසනායකගේ පොඩිහාමිනේ යුවළගේ පවුලේ දෙවෙනි පිරිමි දරුවා ලෙස උපන් ඔහුට දෙමාපියෝ තැබූ නම ''ජෝර්ජ් එස්මන් ජයසිංහ'' විය. දකුණු තලංගම විද්‍යා වර්ධන බෞද්ධ මිශ්‍ර පාඨශාලාවෙන් මූලික අධ්‍යාපනය ලද හෙතෙම පසුව උසස් අධ්‍යාපනය සඳහා රජයේ කලායතනයට ඇතුළත් විය. එහිදී ඔහු චිත්‍ර සහ මූර්ති කලාව හදාරමින් සිටියදී, රෝහල් සුළු සේවා පාලකවරයකු වූ සිය පියාගේ අකල් වියෝව හේතුවෙන් අධ්‍යාපන කටයුතු අතරමග හැරදමන්නට සිදුවිය. පියා නැති පවුලේ බර දරමින් විවිධ ආයතනවල ප්‍රචාරණයට අදාළ රැකියා කීපයක්ම කිරීමෙන් පසු ඔහු ලේක්හවුස් ආයතනයේ මාධ්‍යවේදියකු ලෙස රැකියාවට බැඳුණේය. චිත්‍ර ශිල්පියකු ලෙස ඔහු පැමිණි දීර්ඝ ගමනේ සමාරම්භය එහිදී සිදුවූ අතර කෙටි කලක් තුළ ජනප්‍රිය චිත්‍ර ශිල්පියෙකු වීමට ඔහුට හැකි-විය. ''තලංගම ජයසිංහ'' නමැති ප්‍රතිභාපූර්ණ චිත්‍ර ශිල්පියා කලා ලොවට එක්වන්නේ එලෙසිනි.*

*දිනමිණ පුවත්පතට අඳින ලද ''චිත්‍රා'' ඔහුගේ මුල්ම චිත්‍ර කතාව විය. 1957දී ඇරැඹි ඔහුගේ ලේක්හවුස් ජීවිතයේ සන්ධිස්ථානයක් සටහන් කරමින් 1980දී ''මධුර'' චිත්‍ර කතා පත්තරයේ කර්තෘවරයා බවට පත්විය. එදා සිට 1998 වසරේ ලේක්හවුස් ආයතනයෙන් ඉවත්වන තෙක් එම තනතුර දැරූ ඔහු පසුව වෘත්තීය චිත්‍ර ශිල්පියෙක් ලෙස ස්වාධීනව කටයුතු කරන්නට පටන් ගත්තේය.*

*අද වන විට ලංකාදීප පත්‍රයේ නිදහස් කාටූන් ශිල්පියෙකු ලෙස කටයුතු කැපී පෙනෙන භූමිකාවක් නිරූපනය කරමින් සිටී. ''සන්නස'' ඔහු හා මේ පිළිසඳර කතා බහේ යෙදුණේ අතුරුගිරිය සමනල මාවතේ පිහිටි ඔහුගේ නිවෙසේදීය.*

**ඔබගේ අනන්‍යතාව සටහන් වන්නේ ප්‍රවීණ චිත්‍ර ශිල්පියෙක් විදිහට. ඒත් අද දවසේ ඔබ ඉහළම ජනප්‍රියත්වයක් හිමිකරගෙන ඉන්නේ කාටූන් ශිල්පියෙක් විදිහට. චිත්‍ර ශිල්පියා යටපත් කරගෙන කොහොමද හදිසියේම මේ කාටූන් නිර්මාණකරුවා මතුවුණේ?**

ඇත්තටම මම චිත්‍ර ශිල්පියෙක් විතරක් නොවෙයි. තවත් විවිධ ශිල්පවල නියැළුණ, නියැළෙන කෙනෙක්. චිත්‍ර ශිල්පියෙක් විදිහට පත්තරවලට සම්බන්ධ වුණ මුල්ම කාලෙත් මම කාටූන් ඇන්දා. ඒ කියන්නේ මීට අවුරුදු හතලිහකට පනහකට විතර කලින්. 1954දි තමයි දිනමිණ පත්තරේ මගේ මුල්ම කාටූන් එක පළවුණේ. ඒ කාලෙත් මගේ කාටූන් ජනප්‍රිය වුණා. පස්සේ චිත්‍ර ශිල්පියෙක් විදිහට වැඩ වැඩිවෙන කොට කාටූන් අඳින එකෙන් ටිකක් ඉවත් වුණා. එහෙම ඉන්නකොට තමයි මාස කීපයකට කලින් ලංකාදීප පත්තරේ කර්තෘ සිරි රණසිංහ මහත්තයා මට කතා කළේ. දාස හපුවලාන හදිසියේම අසනීප වෙලා කියලා ඔහු ඇඳපු කාටූන් දෙක ඇඳලා දෙන්න කියලා මට කිව්වා. ඒ වෙනකොට මම ලංකාදීපයට ''පලාමල්ල'' කාටූන් එක අඳිනවා. ඒකට අමතරව දාස ඇඳපු කාටූන් දෙකත් මම අඳින්න පටන්ගත්තා. ඒ විදිහට තමයි අලුතෙන් මතුවීම සිද්ධ වුණේ.

**ඔබ අඳින ''ඒතුමා'' කාටූන් එක ඉතාම ජනප්‍රිය, කාටූන් ගුණයෙන් ඉතාම ඉහළ තලයක තියන කාටූන් එකක්. එහි ප්‍රධාන චරිත දෙකත් හරිම අපූර්ව අංග ලක්ෂණ තියන, හාස්‍ය ජනක ඒවා. කොහොමද මේක බිහිවුණේ?**

දාස ඇඳපු කාටූන් දෙක අඳින්න මම බාරගත්තට මොකද ඒ වෙනකොට එහෙම කාටූන් අඳින්න මගේ කිසිම සූදානමක් තිබුණේ නෑ. මුලින්ම මම කළේ දාසගේ කාටූන් චරිතම අරගෙන ඇඳපු එක. පස්සේ ඒක වෙනස් කිරීමේ අවශ්‍යතාවක් මතුවුණා. ඊට පස්සේ මම කල්පනා කළා මොන වගේ කාටූන් එකක්ද අඳින්න ඕනේ කියලා. එතනදි තමයි ඔය ඒ-තුමයි එයාගේ ගෝලය සිරයි දෙන්නගේ චරිත හිතට ආවේ. බොහොම අපූත හාස්‍යජනක පෙනුමක් තියන කාටූන් චරිතයක් ඇඳලා බැලුවාම මට හිතුණා ඒක දේශපාලකයට හොඳට ගැලපෙනවා කියලා. අද කාලේ දේශපාලකයන්ගේ ගෝලයෝ කියන්නේ කොහොමත් මැරයොනේ. මැරයෙක්ගේ අංග ලක්ෂණ ඇතුළත් රූපයක් ගෝලයට ඇන්දා. ටික දවසක් යනකොට මේක බොහොම ජනප්‍රිය වුණා. දාස සනීප වෙලා ආපහු වැඩට ආවම මම දාසගේ කාටූන් අඳින එකෙන් අයින්වෙන්න යනකොට සිරි රණසිංහ මහත්තයා කිව්වා ඒ-තුමා කාටූන් එක ජනප්‍රියයි. ඒ නිසා ඒක නවත්තන්නේ නැතුව දිගටම අඳින්න කියලා. ඒ නිසා දැන් දිගටම ඇඳගෙන යනවා.

**ඔබගේ කාටූන් චරිතවල මුහුණ තුළින් හැඟීම් ප්‍රකාශවීම ඉතාම ඉහළ මට්ටමක තියෙනවා. එක්තරා ආකාරයකට එය ඔබේ කාටූන්වලටම සුවිශේෂී ලක්ෂණයක් කියන්නත් පුළුවන්. කාටූන් ඇඳීමේදී කොහොමද ඒ තත්ත්වය පවත්වගන්නේ?**

පහුගිය දවසක කැමිලස් පෙරේරා මට කතා කළ වෙලාවකත් ඔබ ඔය කියන කාරණය කිව්වා. ඒක මම ආයාශයකින් කරන දෙයක් නෙවෙයි. මම කරන්නේ කාටූන් එකේ අදාළ අවස්ථාවට ගැලපෙන විදිහට චරිතවල මුහුණු අඳින එක. එතකොට ඉබේටම වගේ ඇඳෙන රූප තමයි ඒ. මම හිතන්නේ චිත්‍ර කතා ශිල්පියෙක් විදිහට දීර්ඝ කාලයක් කටයුතු කිරීමෙන් ලැබුව හුරුව නිසා ඒ දේ වෙනවා ඇති කියලයි. මොකද චිත්‍ර ශිල්පයේදී මුහුණෙන් හැඟීම් ප්‍රකාශ කෙරෙන චිත්‍ර අඳින්න පරිචයක් ලැබෙනවා.

**කාටූන්වල දෙබස් ලිවීමේදීත් ඔබ දක්වන කුසලතාව කාටූන් ශිල්පීන් කිසිවෙකුටත් නොදෙවෙනි එකක්?**

මම ලේඛන කලාවත් කරනවානේ. මුල් කාලේ මම වැඩිපුරම කළේ කවි, කෙටිකතා, නවකතා වගේ දේවල් ලියපු එක. ජනතා පත්තරේ, සිළුමිණ පත්තරේ අප්‍රමාණව ඒවා පලවෙලා තියනවා. මම පත්තර රස්සාවට මුලින්ම එකතු වුණොත් මාධ්‍යවේදියක් විදිහටනේ. ඒ කාලේ නොලියපු දෙයක් නෑ. ඒ නිසා බොහොම කෙටියෙන් නිරවුල්ව අවශ්‍ය දෙයක් කියන්නේ කොහොමද කියන එක ගැන මට අදහසක් තියනවා. අර මුලිනුත් කිව්වා වගේ මම චිත්‍ර ශිල්පියෙක් විතරක් නෙවෙයිනේ. ඒ සියලු හැකියාවන්වල ප්‍රතිඵලයක් විදිහට තමයි මගේ කාටූන්වල යම් ගුණයක් තියනවා නම් ඒක පිහිටලා තියෙන්නේ කියලයි මට හිතෙන්නේ. අනික මම කාටූන්වල දෙබස් කීප සැරයක් ලියලා හොඳටම ලියවෙන එක තමයි ගන්නේ. ඒ නිසා සමහර වෙලාවට කාටූන් එක නැවත අඳින්න වෙන වෙලාවලුත් තියනවා.

**ඔබ මාධ්‍යවේදියෙක් විදිහට නම් ඒ තරම් ප්‍රසිද්ධ නෑ. චිත්‍ර ශිල්පියා මාධ්‍යවේදියෙක් වුණේ කොහොමද?**

පත්තරේ තිබුණ දැන්වීමක් දැකලා මම ලේක්හවුස් එකට ඇප්ලිකේෂන් එකක් දැම්මේ චිත්‍ර ශිල්පියෙක් විදහට තමයි. මම වගේම ඒ කාලේ හිටිය චිත්‍ර ශිල්පීන් හාරසිය ගානක් ඒ දැන්වීමට ඇප්ලිකේෂන් දාලා තිබුණා. ඒත් ඇත්තටම මේ දැන්වීම දාලා තියෙන්නේ සුදුසුකම් තියන අයගෙන් කෙනෙක් බඳවගන්න නෙවෙයි. ලේක්හවුස් එකේ ඉහළ නිලධාරියෙක්ගේ දරුවෙකුට රැකියාවක් දෙන්න. එයා වෙනුවෙන් තමයි මේ අලුතෙන් තනතුරක් හදලා දැන්වීමක් දාලා තියෙන්නේ. කොහොම හරි ඔය ඇප්ලිකේෂන් දාපු අයගෙන් තිස් දෙනෙක් විතර ගෙන්නලා සම්මුඛ පරීක්ෂණ පැවැත්තුවා. සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම සුදුසුකම් තිබුණේ මට. ඒත් මාව චිත්‍ර ශිල්පියෙක් විදහට ගන්න විදිහක් නෑ අර නිලධාරියාගේ පුතා මුලින්ම ඒකට තෝරගෙන තිබුණ නිසා. ඒත් චිත්‍ර අඳින්න මගේ තිබුණ දක්ෂතාවය දැක්කට පස්සේ මාව ජර්නලිස් කියලා දිනමිණ කර්තෘ මණ්ඩලයට බඳවා ගත්තා. ඒ නිසා මුල් කාලේ මාධ්‍යවේදියෙක් විදිහට සෑහෙන්න වැඩ කළා. ඒ අතරේ චිත්‍ර ශිල්පි වැඩත් කළා. ඡායාරූප ශිල්පියෙක් විදිහටත් වැඩ කළා. ඔය මාලිගාවිල බුද්ධ ප්‍රතිමාවේ පළවෙනි ඡායාරූපය ගත්තෙත් මමයි.

**ඇයි එච්චරම වැඩ ගොඩක් පැවරුණේ. ඒ කාලේ ලේක්හවුස් එකේ ඡායාරූප ශිල්පියෝ හිටියේ නැත්ද?**

හිටියා. හිටියා. වොලී පෙරේරා, හෙක්ටර් සුමතිපාල වගේ බොහොම දක්ෂ, නම් දරාපු අයත් හිටියා. හැබැයි මේ අය හුගදෙනෙක් කැමති නෑ සෙනසුරාදා ඉරිදා වගේ නිවාඩු දවස්වල වැඩ කරන්න. මොකද ඒ දවස්වල පිට වැඩ තියනවානේ. ඔය කාලේ අපේ කර්තෘවෙලා හිටියේ මීමන ප්‍රේමතිලක මහත්තයා. දුර පළාත්වලින් ප්‍රේමතිලක මහත්තයාට ලැබෙන ලිවුම්වල තියන විශේෂ දේවල්ගැන පරීක්ෂා කරන්න ඒ දවස්වල ප්‍රේමතිලක මහත්තයාම යනවා. හුගාක් වෙලාවට ඒ යන්නේ සෙනසුරාදා ඉරිදා දවස්වලට. මේ ගමන්වලට යන්න අර ඡායාරූප ශිල්පියෝ කැමති නෑ. අදායමක් නෑනේ. ඔය කාලේ මමත් ඡායාරූප ශිල්පය ඉගෙනගෙන හිටියේ. හොඳ කැමරා කීපයකුත් මගේ ළඟ තිබුණා. ප්‍රේමතිලක මහත්තයා මේ ගමන්වලට මාව එක්ක යන්න පටන්ගත්තා. එහෙම ගියාම ෆොටෝ එකකට රුපියල් පනහක් ගානේ ගෙවීමකුත් කරනවා. ඒකෙන් තමයි පත්තරේ ෆොටෝ ග්‍රැෆර් කෙනෙක් වුණේ. මම ගත්ත පින්තූර සිළුමිණේ කොලම් පහේ පින්තූර විදිහටත් පළවෙලා තියනවා.

**මාලිගාවිල බුද්ධ ප්‍රතිමාව හොයාගත්ත කතාව මොකක්ද?**

වැල්ලවාය පැත්තේ මහ කැලෑවක් මැද බුද්ධ ප්‍රතිමාවක් තියනවා කියලා ඒ පළාතේ කෙනෙක් පත්තරේට ලිපියක් එවලා තිබුණා. ඒ ගැන හොයන්න අපි ඒ කිට්ටුව ගමක දහයක් පහළොවක් එක්කගෙන ගියා. පොඩි පොඩි පාරවල් දිගේ හැතැප්ම දාසයක් විතර ඇතුළට ගියාට පස්සේ අපි දැක්කා අර පෝටාවැල්ද මොනාද කියලා තියන වැල් වර්ගයකින් වැහිලා ගල් පිළිමයක් තිබුණා. ඊට ටික දුරක් එහායින් ඒකේ හිස කොටස වෙනම තිබුණා. කැළෑවට යටවෙලා තිබුණ මේ පිළිම කොටස් දෙක පාදාගත්තට පස්සේ මම ඒකේ ඡායාරූප ගත්තා. කන්තෝරුවට ඇවිල්ලා හිසේ ඡායාරූපයයි කඳේ ඡායාරූපයයි දෙක එකට තියලා බුදු පිළිමයේ ඡායාරූපයක් හදලා පත්තරේ දැම්මා. ඔය විදිහට ඒ කාලේ අමතක නොවෙන ඡායාරූප ගොඩක් මම අරගෙන තියනවා. ඒවා පත්තරේ මුල් පිටුවෙම පළවෙලා තියනවා.

**ඔබ විවිධ ශිල්පවල නියැළුණ කෙනෙක් කියලා කිව්වා. මොනවද ඒ වෙනත් ශිල්ප?**

කලා ශිල්ප ඇරුණාම මම ගෘහ නිර්මාණ ශිල්පයත් කරලා තියනවා. මගේ ගෙවල් සැළසුම් කිරීම, ගොඩනැගීම කළෙත් මමමයි. දැන් මේ ඉන්න ගෙදර මම හැදුවේ කුලසිංහ මහත්තයාගේ පෙර සවි කොන්ක්‍රීට් ක්‍රමයට. ඒ මහත්තයා මුණගැහිලා එයාගේ වැඩබිම්වලට ගිහිල්ලා ඒ ක්‍රමය මමත් ඉගෙන ගත්තා. ඒ නිසා ලක්ෂ හතලිහක් විතර යන වැඩේ මට ලක්ෂ පහළොවකින් විතර කරගන්න ලැබුණා. මීට කලින් මම හිටිය මහරගම ගෙදරත් මම කරපු එකක්. ඒ පැත්තේම තිබුණ ලස්සනම ගෙදර ඒක. කාමර දොළහයි.

**චිත්‍ර කතා පත්තර කලාවටත් ඔබෙන් විශාල දායකත්වයක් ලැබුණා නේද?**

චිත්‍ර කතා පත්තර කලාව ලංකාවට හදුන්වා දීමටත් මම දායක වුණා. මම ලේක්හවුස් එකේ ඉන්න කාලේ දවල් කෑම වෙලාවට කොටුවේ ටිකක් එහාට මෙහාට යනවා. එතකොට පොත් සාප්පුවල තිබුණා බටහිර රටවල චිත්‍ර කතා පොත්. මේවා දැක්කම මට හිතුණා මේ විදිහේ චිත්‍ර කතා පත්තරයක් පටන් ගන්න බැරිද කියලා. පස්සේ මම මේ අදහස ලේක්හවුස් එකේ නිලධාරින්ට ඉදිරිපත් කළා. ඒකෙන් තමයි මුල්ම චිත්‍රකතා පත්තරේ විදිහට ''සතුට'' පත්තරේ පටන් ගන්නේ. හැබැයි මගේ යෝජනාව වෙනත් කෙනෙක්ගේ යෝජනාවක් විදිහට තමයි ක්‍රියාත්මක වුණේ. ඒ නිසා මට ඒකේ තැනක් ලැබුණේ නෑ. මම ඉල්ලගෙන ගියෙත් නෑ. පස්සේ සතුට පත්තරේ ලේක්හවුස් එකෙන් ප්‍රකාශයට පත්කෙරෙන එක නැවතිලා ඒ වෙනුවට ''මධුර'' පත්තරේ ගහන්න පටන් ගත්තා. ඒකේ කර්තෘකම මට ලැබුණා. ලේක්හවුස් එකෙන් අයින් වෙනකම්ම මම ඒ තනතුර දැරුවා.

**චිත්‍ර කතා නිර්මාණයේදි තියන නිදහස කාටූන් නිර්මාණයේදිත් ඒ විදිහටම තියනවද?**

කාටූන් අඳිනකොට නිදහස සීයට පනහක්

19 වන පිටට

සටහන සහ ඡායාරූප
ශ්‍රීලාල් සෙනෙවිරත්න

